**ශ්‍රී ලංකාවේ දුම්රිය ස්ථානයන්හි වාස්තු විද්‍යාත්මක වෙනස්කම් කෙරෙහි බලපාන මුඛ්‍ය සාධක (තෝරා ගත් ස්ථානයන් ඇසුරින්)**

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***පී. ජී. කේ. දිලානි පෙරේරා***[1]

***අනුර මනතුංග***[2]

**සංක්ෂේපය**

පුරාවිද්‍යාව යන විෂය ක්ෂේත්‍රය මිනිසාගේ අතීතය ද්‍රව්‍යාත්මක සාධක ආශ්‍රයෙන් විග්‍රහ කිරීම හා අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කර කළමනාකරණය යන්න අන්තර්ගතය. එකී විෂය ක්ෂේත්‍රය තුළ  බහු විෂයික එකතුවක් පවතින හෙයින් කාර්මික පුරාවිද්‍යාව සඳහා හිමිවනුයේ අතිශය වැදගත් ස්ථානයකි. කාර්මික විප්ලවය නිසා සිදු වූ භෞතිකමය වෙනස්කම් පසු කාලීන අවභාවිතය හේතුවෙන් මෙම විෂයෙහි ආගමනය සිදු විය. කාර්මික පුරාවිද්‍යාව යටතේ අනු විෂයන් කිහිපයක් පැවතිය ද ඒ අතර දුම්රිය ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත ස්මාරක වැදගත්ය. මෙම පර්යේෂණය මඟින් ශ්‍රී ලංකාවේ දුම්රිය ක්ෂේත්‍රය ආශ්‍රිත ප්‍රධාන ස්මාරක විශේෂයක් වන දුම්රිය නැවතුම් ස්ථාන ආශ්‍රිත ව පවතින ගොඩනැගිලිවල වාස්තු විද්‍යාත්මක වෙනස්කම් පිළිබඳව අධ්‍යනයක් සිදු කරනු ලබයි. මෙහි දී ප්‍රධාන දේශගුණික කලාප වන කඳුකර කලාපය , සම භූමි ආශ්‍රිත කලාපය සහ වෙරළබඩ කලාපය  මූලික කර ගනිමින් එම ප්‍රදේශයන්හි ස්ථානගතව ඇති ප්‍රධාන දුම්රිය නැවතුම් ස්ථාන ත්‍රිත්වයක වාස්තු විද්‍යාත්මක වෙනස්කම් කොතෙක් දුරට දුම්රිය ගොඩනැගිලි කෙරෙහි බලපෑමක් සිදු කර පැවතියේ ද යන්න විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මූලික අරමුණ වෙයි. එහි අන්තර්ගත වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සමාජීය තත්වය ප්‍රමුඛ කර ගනිමින් විමර්ශනයේ යෙදෙන හෙයින් ද්විතීයික හා ප්‍රාථමික මූලාශ්‍රයන්ට නැඹුරුතාවක් දක්වමින් මානව විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදයන් මෙන්ම පුරා විද්‍යා විෂයේ දී භාවිත කරනු ලබන ක්‍රමවේදයන් ද අනුගමනය කරනු ලබයි. පුරාවිද්‍යාත්මක න්‍යාය යටතේ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ගවේෂණය මූලික කර ගනිමින් දත්ත නිරීක්ෂණය , සමීක්ෂණය හා වාර්තාකරණය සිදු කරන අතර මානව විද්‍යාත්මක ක්‍රමවේදය ලෙස සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරන ලදි. සමස්තයක් ලෙස පර්යේෂණය සඳහා වෙන් කර ගනු ලැබූ ගොඩනැගිලි පිළිබඳ ස්වයං අධ්‍යයනය හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණන් හි වෙනස්කම් වාස්තු විද්‍යාත්මක , අමුද්‍රව්‍ය , වහල , අවකාශ භාවිතය හා නවීකරණය වීමේ ප්‍රවණතාව යන මූලික විභේදනය යටතේ වගු , සැලසුම් , ප්‍රස්තාර උපයෝගී කර ගනිමින් විශ්ලේෂණය සිදු කරනු ලබයි. වර්තමානයෙහි සිදු වන සීඝ්‍ර ගෝලීයකරණය හමුවෙහි මෙම ගොඩනැගිලි නවීකරණයට දක්වන නැඹුරුතාව ප්‍රමාණාත්මකව සැලකීමේ දී වර්ධනීය අගයක් පෙන්නුම් කරන හෙයින් ඒ සඳහා යෝග්‍ය වන යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීම ද සිදු කරනු ලබයි. කෙසේ වූව ද 19 වන සියවසෙහි මුල් භාගයේ දී ශ්‍රී ලාංකේය දුම්රිය මාර්ග හා සම්බන්ධ ස්මාරකයක් වන දුම්රිය නැවතුම් පොළවල් ස්ථානගත කිරීමේ දී පාරිසරික සාධක හා විවිධ භූගෝලීය සාධකයන්හි පැවති විෂමතා උපයෝගී කර ගෙන ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද - පුරාවිද්‍යාව, කාර්මික පුරාවිද්‍යාව, වාස්තු විද්‍යාත්මක, දුම්රිය ක්ෂේත්‍රය, දුම්රිය නැවතුම් පොළ

*1. පුරාවිද්‍යාව, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*